# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2014 අංක 45 දරන මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 නොවැම්බර් මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 නොවැම්බර් මස 28 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 4.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 20.00 යි.

# 2014 අංක 45 දරන මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2014 නොවැම්බර් මස 24 වන දින]

එල්.ඩී.—ඕ. (අයි. එන්. සී.) 19/2013.

**1988 අංක 75 දරන මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1988 අංක 75 දරන මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත මගින් මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය සංස්ථාගත කරන ලද හෙයින් ද: පූර්විකාව.

තවද, එකී මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය සිය නාමය "විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා වූ චිත්‍රා ලේන් ශුභ සාධක සමිතිය" යනුවෙන් වෙනස් කිරීමට අදහස් කර සිටින හෙයින් ද:

තවද, එකී මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය විසින් සිය නාමය වෙනස් කර ගැනීම බලාත්මක කර ගැනීම සඳහා එකී පනත සංශෝධනය කිරීමට දැන් ඉල්ලුම් කර ඇති අතර, එම ඉල්ලීම ඉටු කිරීම යෝග්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2014 අංක 45 දරන මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මේ පනතේ මින්පසු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 75 දරන මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනතේ දීර්ඝනාමය හැර, එම පනතේ හෝ ඒ පනත යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් රීතියක, දැන්වීමක හෝ වෙනත් ලේඛනයක හෝ "මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය" යන නාමයෙන් හෝ එහි යම් කෙටි නාමයකින් හෝ "මානසික උපප්‍රකෘති ළමා පාසැලේ 1988 අංක 75 දරන මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනතට කරනු ලබන පොදු සංශෝධනය.

ශුභ සාධක සමිතිය" සම්බන්ධයෙන් සඳහන් කර ඇති සෑම පද සම්බන්ධයක දී ම පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස "මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය" යන වචන වෙනුවට "විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා වූ චිත්‍රා ලේන් ශුභ සාධක සමිතිය" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.—

කොන්ත්‍රාත්තු, ගිවිසුම්, නඩු, අභියාචනා, අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් යනාදිය නොකඩවා පවත්වාගෙන යාම.

3. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දිනයට පෙරාතුව "මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය" විසින් හෝ එකී සමිතිය වෙනුවෙන් සාදන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද සියලු කොන්ත්‍රාත්තු, ගිවිසුම්, සහතික හෝ වෙනත් සාධනපත්‍ර හෝ කවරාකාර හෝ ලේඛන, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දින සිට සහ ඉන්පසුව "විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා වූ චිත්‍රා ලේන් ශුභ සාධක සමිතිය" විසින් හෝ එකී සමිතිය වෙනුවෙන් සාදනු ලැබූ, නිකුත් කරන ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ ලෙසට සළකනු ලැබිය යුතු ය.

(2) "මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය" විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පැවැති සියලුම නඩු, නඩු කටයුතු අභියාචනා සහ අනෙකුත් නීති කෘත්‍ය නතර කිරීම හෝ පවත්වාගෙන යාම නතර කිරීම නොකළ යුතු අතර, ඒවා "විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා වූ චිත්‍රා ලේන් ශුභ සාධක සමිතිය" විසින් හෝ ඊට එරෙහිව නොකඩවා පවත්වාගෙන යායුතු අතර, බලාත්මක කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී (1) වන උපවගන්තියේ දක්වා ඇති අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් හැර "මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතියේ" සියලුම අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් "විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා වූ චිත්‍රා ලේන් ශුභ සාධක සමිතියේ" අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් ලෙස සළකනු ලැබිය යුතු ය.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "අවුරුදු පහකට නොඅඩු සාමාජිකත්වයක්" යන වචන වෙනුවට "අවුරුදු දෙකකට නොඅඩු සාමාජිකත්වයක් " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්—

"(3අ) භාරකාර මණ්ඩලයේ උපරිම සාමාජික සංඛ්‍යාව දහයක් විය යුතු ය ."

**5.** "විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා වූ චිත්‍රා ලේන් ශුභ සාධක සමිතිය" සියලු කාර්ය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මගින් පිහිටුවන ලද "මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතියේ" අනුප්‍රාප්තිකයා ලෙස සළකනු ලැබිය යුතු බවට යම් සැකයක් දුරුකිරීමේ කාර්යය සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. සැකදුරු කිරීම.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.